# මාධ්‍ය නිවේදනය

## වසර 2018 දී රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය

**වාරික ආදායම සහ වර්ධන අනුපාතිකය**

වසර 2018 දී ශ්‍රී ලාංකේය රක්ෂණ ක්ෂේත්‍රය, දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ද්විත්වය සඳහා සමස්ත දළ ලිඛිත වාරිකයෙහි 10.03% ක වර්ධනයක් අත්පත් කරගැනීමට සමත් විය. වසර 2017 දී වාර්තා වූ රු. මිලියන 164,960 හා සැසඳීමේදී, 2018 දී මුළු දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 181,506 ක් වශයෙන් දැක්වුනු අතර එය රු. මිලියන 16,546 කින් ඉහළ යාමකි.

දිගු කාලීන රක්ෂණ ක්ෂේත්‍රයෙහි දළ ලිඛිත වාරික ආදායම 2017 දී වාර්තා වූ රු. මිලියන 71,571 ට සාපේක්ෂව වසර 2018 දී රු. මිලියන 80,303 ක් වශයෙන් දැක්වුනු අතර එය 12.20% ක වර්ධනයකි. 8.37% ක වර්ධනයක් සමගින් 2018 දී සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 101,203 ක් වශයෙන් වාර්තා වූ අතර 2017 දී එය රු. මිලියන 93,389 ක් විය.

2018 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ අනිවාර්ය ප්‍රතිරක්ෂණ පවාරනය හරහා ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) මගින් උපයන ලද ප්‍රතිරක්ෂණ වාරික ආදායම රු. මිලියන 4,056 ක් වූ අතර, එය 2017 දී වාර්තා වූ රු. මිලියන 3,683 ට සාපේක්ෂව 10.13% ක වර්ධනයකි. (1 වගුව බලන්න)

**රක්ෂණ ව්‍යාප්තිය සහ ඝනත්වය**

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් නිරූපනය වන රක්ෂණ ව්‍යාප්තිය වසර 2018 දී 1.26% ක් වශයෙන් වාර්තා විය. 2017 දී වාර්තා වූ 1.23% ට සාපේක්ෂව රක්ෂණ ව්‍යාප්තිය සුළු වශයෙන් ඉහළ ගියද, ආසියානු කලාපයේ සෙසු රටවල් වලට සාපේක්ෂව එය තවදුරටත් පහළ මට්ටමක පවතී. 2018 වසරේ දී දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය 0.56% වශයෙන් දැක්වුනු අතර (2017 ඃ 0.53%), සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ එය 0.70% වශයෙන් දැක්විණි (2017 ඃ 0.70%). එහිදී 2017 හි වාර්තා වූ රක්ෂණ ව්‍යාප්ති අනුපාතිකයට සාපේක්ෂව දිගු කාලීන රක්ෂණ ක්ෂේත්‍රයේ සුළු ඉහළ යාමක් දක්නට ලැබිණි. රක්ෂණ ව්‍යාප්තිය කෙරෙහි වැය කළ හැකි ආදායම ඍජුව බලපාන අතර, පහළ ව්‍යාප්ති මට්ටම් කෙරෙහි හේතු පාදක වූ සෙසු සාධක වනුයේ රක්ෂණය පිළිබඳව ඇති වූ අනර්ථකාරී අවබෝධයන් සහ පිරිනමනු ලබන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයි. සමස්ත ජනගහනයෙන් එක් පුද්ගලයකු සඳහා වන රක්ෂණ වාරික ආදායම ඔස්සේ නිරූපනය වන රක්ෂණ ඝනත්වය, 8.87% ක වර්ධනයක් අත්කර ගනිමින් 2017 දී වාර්තා වූ රු. මිලියන 7,693 ට සාපේක්ෂව රු. මිලියන 8,376 ක් වශයෙන් දැක්විණි.

**මුළු වත්කම්**

රක්ෂණ සමාගම් සතු වත්කම් වල වටිනාකම, 2017 දී වාර්තා වූ රු. මිලියන 581,685 ට සාපේක්ෂව වසර 2018 දී 7.18% ක වර්ධනයක් සමගින් රු. මිලියන 623,477 දක්වා ඉහළ නැංවිනි. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් වල වටිනාකම පසුගිය වසරට වඩා 9.65% ක වර්ධනයක් විදහා දක්වමින් රු. මිලියන 429,706 ක් (2017 ඃ රු මිලියන 391,890) වශයෙන් වාර්තා විය. 2018 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් වල වටිනාකම රු. මිලියන 190,088 ක් වූ අතර (2017ඃ රු. මිලියන 185,583), එය පසුගිය වසරට සාපේක්ෂව 2.43% ක වර්ධනයකි.

ස්වකීය ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ජාතික ප්‍රතිරක්ෂකයා වන, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි වත්කම් වල වටිනාකම 2018 දී රු. මිලියන 3,683 ක් වූ අතර (2017 ඃ රු. මිලියන 4,212) එය පසුගිය වසරට වඩා 12.56% ක සෘණාත්මක වර්ධනයක් වාර්තා කලේය. තවද, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ආශ්‍රිත මූල්‍යමය ආයෝජනයන්හි සැළකිය යුතු පහළ යාමක් දක්නට ලැබිණි.

**රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්පෑම් ගෙවීම්**

දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යන ද්විත්වයෙහිම රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්පෑම් ගෙවීම් රු. මිලියන 86,803 ක් (2017 ඃ රු. මිලියන 74,178) වශයෙන් වාර්තා වූ අතර එය මුළු හිමිකම්පෑම් වල 17.01% ක වර්ධනයකි. කල්පිරීමේ සහ මාර්ත්‍යතාව ප්‍රතිලාභද ඇතුළුව, දිගු කාලීන රක්ෂණ හිමිකම්පෑම් සඳහා දරන ලද ගෙවීම රු. මිලියන 34,337 ක් (2017 ඃ රු. මිලියන 26,371) විය. රථවාහන, ගිනි, නාවික සහ සෙසු කාණ්ඩයන් ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හිමිකම්පෑම් සඳහා දරන ලද ගෙවීම රු. මිලියන 52,466 ක් (2017 ඃ රු. මිලියන 47,807) ක් විය. ඒ අනුව, වසර 2017 සමග සැසඳීමේදී, 2018 දී දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් වෙනුවෙන් හිමිකම්පෑම් සඳහා දරන ලද ගෙවීම පිළිවෙලින් 30.21% ක සහ 9.74% ක ඉහළ යාමක් වාර්තා කලේය. (3 වගුව බලන්න)

**රක්ෂණ සමාගම් වල ලාභදායීත්වය**

වසර තුළ පැවති පොලී අනුපාතිකයෙහි උච්ඡාවචනයන් සහ වෙනත් ආර්ථිකමය අවහිරතා රක්ෂණ ක්ෂේත්‍රයේ ලාභදායීත්වය කෙරෙහි අහිතකර අයුරින් බලපෑවේය. 2018 දී රක්ෂණ ක්ෂේත්‍රය රු. මිලියන 37,017 ක (2017 ඃ රු. මිලියන 49,084) බදු වලට පෙර ලාභයක් වාර්තා කළ අතර එයට රු. මිලියන 229 ක් (2017 ඃ රු. මිලියන 128) ක් වූ වගා රක්ෂණ සහ රු. මිලියන 1,342 ක් (2017 ඃ රු. මිලියන 136) ක් වූ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර ආදී ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සෙසු ව්‍යාපාරයන්හි ලාභයද ඇතුළත් විය. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ලාභදායීත්වය රු. මිලියන 24,127 ක් (2017 ඃ රු. මිලියන 39,349) ක් වශයෙන් වාර්තා වූ අතර ඒ සඳහා ජනශක්ති රක්ෂණ සමාගම ස්වකීය පරිපාලිතයක් වන ජනශක්ති

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය විකිණීම මගින් උපයන ලද සැළකිය යුතු ලාභය ප්‍රධාන වශයෙන් දායක විය.

වසර 2017 දී, කොමිසම මගින් ඒකෝච්ත අතිරික්තය හඳුනාගැනීම සහ පිළියම් යෙදීම සඳහා අංක 16 දරන නියෝගය නිකුත් කරන ලදී. ඒ අනුව, ප්‍රධාන පෙලේ දිගු කාලීන රක්ෂණ සමාගම් කිහිපයක් මගින් අදාළ නියෝගයෙහි දක්වෙන අවශ්‍යතා කෙරෙහි අනුගත වෙමින් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සහභාගීත්ව ව්‍යාපාරයන් හැර ඒකෝච්ත අතිරික්තය කොටස් හිමිකරුවන්ගේ අරමුදල වෙත මාරු කරන ලදී. මෙම ඒකෝච්ත අතිරික්තය මාරු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දී දිගු කාලීන රක්ෂණ සමාගම් විසින් ලාභදායීත්වය රු. මිලියන 39,349 දක්වා 67.57% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරන ලදී.

වසර තුළ සමාගම් අතර පැවති තරඟකාරීත්වය සහ මිල පීඩනය හමුවේ වුවද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පසුගිය වසරට වඩා 19.52% ක වර්ධනයක් සමගින් රු. මිලියන 11,318 ක (2017 ඃ රු. මිලියන 9,469) ලාභදායීත්වයක් වාර්තා කලේය.

**ආරවුල් නිරාකරණය සහ විමර්ශන**

ස්වකීය සමස්ත අරමුණ වන රක්ෂණ ඔප්පුහිමියන්ගේ අභිමතයන් සුරැකීම යටතේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම මගින්, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ඔප්පු සම්බන්ධ රක්ෂණ හිමිකම්පෑම් ආශ්‍රිත රක්ෂණ ඔප්පුහිමියන්ගේ ගැටළු සම්බන්ධයෙන් අදාළ විමර්ශනයන් සිදුකරනු ලැබේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම මගින් කවර හෝ රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුට එරෙහිව සිදු කරනු ලබන ඕනෑම වෙනත් පැමිණිල්ලක් සම්බන්ධයෙන්ද විමර්ශනයන් සිදු කෙරේ. වසර 2018 දී, නව ගැටළු 247 ක් කොමිසම හමුවට ඉදිරිපත් කෙරිණි. අදාළ කාලපරිච්ඡේදය තුළ සමස්ත ගැටළු 295 ක් (ඉදිරියට ගෙන ආ ගැටළුද ඇතුළුව) නිරාකරණය/අවසන් කිරීම සිදු කෙරිණි. කොමිසමෙහි මැදිහත්වීම මත, කාලපරිච්ඡේදය තුළ නිරාකරණය කරන ලද ගැටළු වල මුළු වටිනාකම, රු මිලියන 38 ක් පමණ වේ.


**රක්ෂකයින්**

2018 දෙසැම්බර් මස 31 දින වන විට රක්ෂණ සමාගම් (රක්ෂකයින්) විසි පහක් (25) මෙහෙයුම් කටයුතු වල නිරත වූ අතර, ඉන් දොළහක් (12) දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහිද, එකොළහක් (11) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහිද, දෙකක් (2) සංයුක්ත සමාගම් (දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් ද්විත්වයෙහිම කටයුතු කරන) වශයෙන්ද කටයුතු කලේය.


**රක්ෂණ තැරැව්කරුවන්**

කොමිසමෙහි ලියාපදිංචි වූ, රක්ෂණ තැරැව්කාර සමාගම් හැට පහක් (65), වෙළඳපොල තුළ සිය මෙහෙයුම් සිදුකරමින් රු. මිලියන 25,063 ක වටිනාකමින් යුත් දළ ලිඛිත වාරික වටිනාකමක් උත්පාදනය කලේය. ඒ අනුව, වසර 2017 දී වාර්තා වූ රු. මිලියන 21,479 ට සාපේක්ෂව, 2018 දී රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උපයන ලද දළ ලිඛිත වාරික වටිනාකම 16.69% ක වර්ධනයක් වාර්තා කලේය. තවද, සමස්ත දළ ලිඛිත වාරික ආදායම දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ඔස්සේ උපයන ලද වාරික ආදායමෙන් සමන්විත වන අතර, එම අගයයන් පිළිවෙලින් රු. මිලියන 655 ක් සහ රු. මිලියන 24,408 ක් වශයෙන් වාර්තා විය.


**1 වගුව දළ ලිඛිත වාරික ආදායම**




2 වගුව මුළු වත්කම්




3 වගුව රක්ෂණ සමාගම් මගින් ගෙවන ලද හිමිකම්පෑම්



**4 වගුව -ඒකෝච්ත අතිරික්තය මාරු කිරීමෙන් පසු රක්ෂණ සමාගම් වල ලාභය (බදු වලට පෙර)**




*සටහන් ඃ*

*1) 2018 - කාලීන සංඛ්‍යා*

*2) 2017 - ප්‍රතිප්‍රකාශිත විගණනය කරන ලද සංඛ්‍යා*

*3) වසර 2017 සඳහා අන්තර් කාණ්ඩ බැහැර කිරීම් (ජීවිත හා සාමාන්‍ය) බලනොපැත්වීය.*

*4) මුළු ලාභදායීත්වය වගා සහ ප්‍රතිරක්ෂණ බදු වලට පෙර ලාභයෙන් සමන්විත වන අතර එම අගයයන් පිළිවෙලින් රු මිලියන 229 (2017 ඃ රු මිලියන 128) සහ රු මිලියන 1342 (2017 ඃ රු මිලියන 136) වේ.*


**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

**11 වන මහල, නැගෙනහිර කුළුණ**

**ලෝක වෙළඳ මධ්‍යස්ථානය**

**කොළඹ 1.**

| | |
|---|---|
| වෙබ් අඩවිය: www.ircsl.gov.lk | ඊ මෙල්: info@ircsl.gov.lk |
| දුරකථන අංක: 011 2396184 - | ෆැක්ස් : 011 2396190 |


**09/08/2019**